සමාජයේ තවමත් භාවිතා වන ඇතැම් යෙදුම් ඔස්සේ සිදුවිය හැකි අනිටු ප්‍රතිඵල තිබේ. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, අප සමාජයේ තවමත් භාවිතා වන ඇතැම් යෙදුම් ඔස්සේ යම් යම් ආබාධ සහිත වූවන්ට වෙනස් ලෙසින් සැලකුම් ලැබීම සහ කොන් කිරීමක් සිදුවිය හැකි අතර, ඔවුන්ට එම යෙදුම් නිසා සිත්වේදනාවන් ඇති වීමද විය හැක්කකි.

එවැනි යෙදුමකට උදාහරණයක් ලෙසට, ලංකාදීප පුවත් වාර්තාවක (02/23) සඳහන් වන "ගොළු දැරිය" යන්න දැක්විය හැක. මෙම පුවත් වාර්තාවේ අන්තර්ගතය වන්නේ එම ශ්‍රවණ ආබාධයක් සහිත තැනැත්තියට කර්ණ ශංඛයක් බද්ධ කිරීමේ ධනාත්මක පුවතක් වුවත්, "ගොළු දැරිය" යන යෙදුමෙන් පොදුවේ එවැනි ආබාධ සහිත අයවලුන් සම්බන්ධයෙන් සමාජය තුළ ඇති කෙරෙනා හැඟීම නිෂේධ නොවේ.

එනිසා, එවැනි යෙදුම් වෙනුවට 'ශ්‍රවණ ආබාධයක් සහිත' වැනි වඩාත් ආචාර ධාර්මිකව යෝග්‍ය යෙදුම් භාවිතා කරන මෙන්, අපි මාධ්‍ය වෙත සිහිකැඳවමු.

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa